දිවි තොර කරගැනීම් පිළිබඳ පුවත් වාර්තා කිරීමේදී, ඒ පිළිබඳ විශේෂ සැලකිලිමත් වීමක් හා ආචාර ධාර්මික වීමක් තිබීම අනිවාර්ය කරුණකි. මන්ද යත්, ආචාර ධාර්මික නොවන ලෙසින් දිවි තොර කරගැනීම් වාර්තා කිරීමද, දිවි තොර කරගැනීම් වසංගතයක් ලෙසින් පැතිර යෑමට හේතු සාධක විය හැකි බැවිනි.

උදාහරණයක් ලෙසින්, බොහෝ මුද්‍රිත හා රූපවාහිනී මාධ්‍ය තුළ ආවරණය වී තිබූ, මහියංගනයේ දී තරුණියක් දිවි තොර කරගැනීමේ සිදුවීම ගත හැක.

1) දිවි තොර කරගැනීම් සම්බන්ධ සිදුවීම් මුල් පිටුවේ හෝ ප්‍රමුඛතාවයකින් යුතුව පළ කිරීම ඔස්සේ, ඊට වැඩි අවධානයක් යොමු වීමත්, දිවි තොර කරගැනීමේ නැඹුරුවක් ඇති අයෙකු හට එය සෘණාත්මක බලපෑමක් කිරීමත් සිදුවිය හැක.

2) ඇතැම් විටක එය මහජන බැඳියාවට අදාළ විය හැකි කරුණක් වුවත්, දිවි තොර කරගත් ආකාරය දීර්ඝ ලෙස විස්තර කිරීමත් මඟින්, දිවි තොර කරගැනීමේ නැඹුරුතාවක් ඇති අයෙකු අනුකාරක දිවි තොර කරගැනීම් වෙත යොමු වීමේ හැකියාවක් පවතී.

3) දිවි තොර කරගත් අයගේ ඡායාරූපය දැක්වීම ඔස්සේ, ඒ අයගේ පවුලේ සාමාජිකයන් තුළ එම සිදුවීම නිසාත්, දිවි තොර කරගැනීම් හා බැඳුනු සමාජ අගතිය නිසාත්, දැනටමත් ඇති වී තිබිය හැකි සිත් වේදනාවන් සහ මානසික පීඩාවන් තවදුරටත් තීව්‍ර විය හැක.

4) දිවි තොර කරගැනීම් පිළිබඳ වාර්තාවන් සමඟ උපකාරක අංක දැක්වීම ඔස්සේ, දිවි තොර කරගැනීමේ නැඹුරුතාවයක් ඇති අයෙකු උපදේශන සේවාවන් වෙත යොමු වීමට පෙළඹවීමත්, ඒ ඔස්සේ ජීවිතයක් ගලවා ගැනීමට පිටුවහලක් ලැබීමත් විය හැක.

දිවි තොර කරගැනීම් වාර්තාකරණයේදී ඉහත දැක්වූ ආකාරයේ ආචාර ධාර්මික උල්ලංඝනයන්ගෙන් වැළකීම ඔස්සේ, දිවි තොර කරගැනීමේ පුවත් වාර්තාවන් නිසා තවත් දිවි තොර කරගැනීම් වසංගතයක් ලෙසින් පැතිර යෑමේ ඉඩ කඩ අවම කරගැනීමට හැකිවනු ඇත. එය මාධ්‍ය අත ඇති සමාජ වගකීමක්ද නොවන්නේ ද?

(සිංහල භාෂා පුවත්පත් වල සහෝදර ඉංග්‍රීසි පුවත්පත් තුළ එම දිනයන් තුළදී මෙම සිදුවීම වාර්තා වී නොතිබුණි)

හදිසි උපකාරක අංක:
CCCline - 1333
ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860

ජාතික මානසික සෞඛ්‍ය ආයතනය - 1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවිඩ මාර්ගයෙන් සම්බන්ධ කර ගත හැක)

මූලාශ්‍ර:
https://www.hhs.gov/.../what-does-suicide.../index.html
https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...
https://www.imediaethics.org/the-ethics-of-reporting-on.../